කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2016

2022 - මැයි

**BCOM E 3072 - විගණනය හා සහතික වීම**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහයි : (05) කාලය : පැය 03 යි

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්ණ හතරකට (04) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්ණ අංක 01**

ඔබ B&S Partners හි විගණන සුපරීක්ෂකවරයෙකු වන අතර, ඔබ විසින් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වන වසර සඳහා, Bricks (Pvt) Ltd හි විගණනය සැලසුම් කරමින් සිටී. සමාගම වසර කිහිපයක් පුරා ඔබේ විගණන ආයතනයේ සේවාදායකයකු වන අතර, මෝටර් රථ ටයර් නිෂ්පාදනය සහ එහි නිෂ්පාදන, තොග සහ සිල්ලර වෙළෙන්දන්ට විකිණීම සිදු කරයි. විගණන කළමණාකරු, මූල්‍ය අධ්‍යක්ෂ සමඟ සැලසුම් රැස්වීමකට සහභාගී වූ අතර, රැස්වීමේ සටහන් සහ මූල්‍ය ප්‍රකාශන උපුටා ගැනීම් පහත ඔබට සපයා ඇත.

**සැලසුම් රැස්වීම් සටහන්**

Bricks (Pvt) Ltd සිය ටයර් වලින් දළ වශයෙන් 40%ක්, තොග පාරිභෝගිකයන් වෙත අලෙවි කරයි. මෙම ගනුදෙනුකරුවන් භාණ්ඩ මිලදී ගන්නේ විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත ය. ගිවිසුමේ නියමයන් යටතේ, තොග ගනුදෙනුකරුවන්ට දින 60ක් ඇතුලත දඩයකින් තොරව එම භාණ්ඩ හරවා එවිය හැකිය. මූල්‍ය අධ්‍යක්ෂවරයා 10% ක ප්‍රතිලාභ අනුපාතයක් උපකල්පනය කර ඇත. කෙසේ වෙතත්, ඔහුට දැන් මෙය අධික බව හැඟෙන අතර, මෙය 5% දක්වා වෙනස් කිරීමට අදහස් කරයි.

2020 දෙසැම්බර්, Bricks (Pvt) Ltd හි මූල්‍ය පාලකවරිය, එම සමාගමට එරෙහිව වංචනික ගනුදෙනු ගණනාවක් සිදු කර ඇති බවට චෝදනා ලැබීමෙන් පසු සේවයෙන් පහ කරන ලදී. ඇය චෝදනාවලට විරුද්ධ වන බැවින්, අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීම සඳහා සමාගමට නඩු පවරන බවට තර්ජනය කර ඇත. අවශ්‍ය ගැලපීම් වටිනාකම හඳුනා ගැනීම සඳහා, සමාගම විසින් වංචාවේ ප්‍රමාණය විමර්ශනය කිරීම ආරම්භ කර ඇත්තේ මෑතකදී ය,

2020 දෙසැම්බර් මාසයේදී සැලකිය යුතු ටයර් කාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී ගැටලුවක් ඇති වූ අතර, එය ඒවායේ ගුණාත්මක භාවයට බලපෑවේය. කිසිදු ටයරයක් ගණුදෙන්කරුවන්ට යැවීමට පෙර මෙම ගැටළුව හඳුනාගෙන ඇති අතර, කළමනාකාරිත්වය විසින් ගැටළු නිවැරදි කර, ඉන් අනතුරුව ටයර් අලෙවි කළ හැකිද යන්න පිළිබඳව විමර්ශනය කරමින් සිටයි.

Bricks (Pvt) Ltd හි මූල්‍ය අධ්‍යක්ෂවරයා ඔබට දන්වා ඇත්තේ, 2020 සැප්තැම්බර් මාසයේදී, ප්‍රධාන පාරිභෝගිකයෙකුට ඔහුගේ මූල්‍ය දුෂ්කරතා සලකා බලා මාස හයක ගෙවීම් විරාමයක් ලබා දුන් බවයි. Bricks (Pvt) Ltd විසින් වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා වෙන්කිරීමක් පවත්වාගෙන යන අතර, එය පෙර වසරේ පැවති මට්ටමේම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පසුගිය වසරේ විගණනයෙන් පසුව B&S Partners විසින් නිකුත් කරන ලද කළමණාකරණ ලිපියේ Bricks (Pvt) Ltd හි මිලදී ගැනීමේ චක්‍රය සම්බන්ධයෙන් සැලකිය යුතු අඩුපාඩු ඉස්මතු කර ඇත.

වසර අවසානයෙන් පසු, සමාගම සිය ණය මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමට අදහස් කරන බවත්, සමස්ත ණය ගැනීමේ පිරිවැය අඩු කිරීම සඳහා සිය ණය ඒකාබද්ධ කිරීමට බලාපොරොත්තු වන බවත්, මූල්‍ය අධ්‍යක්ෂවරයා ඔබට දන්වා ඇත. සැලසුම් සහගත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, Bricks (Pvt) Ltd මේ වසරේ එහි කොටස් හිමියන්ට ලාභාංශයක් නොගෙවූ අතර, ඒ වෙනුවට එහි රු. 0.50 ප්‍රසාද කොටස් නිකුතුවක් සිදු කරනු ලබයි.

මූලික විශ්ලේෂණ සමාලෝචනය සම්පූර්ණ කරන ලෙස විගණන කළමනාකරු විසින් ඔබෙන් ඉල්ලා ඇති අතර, ඇය ඔබට පහත තොරතුරු සපයා ඇත:

මාර්තු 31 න් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන උපුටා ගැනීම්

| | **පුරෝකථනය 2021**<br>**රු.000** | **සත්‍ය 2020**<br>**රු.000** |
|---|---|---|
| ආදායම | 23,200 | 21,900 |
| විකුණුම් පිරිවැය | (18,700) | (17,300) |
| දළ ලාභය | **4,500** | **4,600** |
| | | |
| මූල්‍ය පිරිවැය | 290 | 250 |
| බදු පෙර ලාභය | **450** | **850** |
| | | |
| තොග | 2,100 | 1,600 |
| | | |
| දිගු කාලීන හා කෙටි කාලීන ණය ගැනීම් | 13,000 | 11,000 |
| මුළු ප්‍රාග්ධනය | 10,000 | 9,500 |

Bricks (Pvt) Ltd සඳහා ඒවා නිවැරදි යැයි ඔබ විසින් තහවුරු කර ඇත. ප්‍රධාන අනුපාත කිහිපයක් විගණන සහකාර විසින් දැනටමත් ගණනය කර ඇත. වෙළඳ ලැබිය යුතු මුදල් එකතු කිරීමේ කාලය දින 38 සිට 51 දක්වා වැඩි වී ඇති බව ඇය තහවුරු කර ඇත.

*අවශ්‍ය වන්නේ:*

(අ) වංචා සහ දෝෂ වැලැක්වීම සහ අනාවරණය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම විස්තර කරන්න.

(ලකුණු 03)

(ආ) Bricks (Pvt) Ltd හි විගණනය සැලසුම් කිරීමේදී ඔබට උපයෝගි කර ගැනීම සඳහා, අනුපාත තුනක් වසර දෙක සඳහා ගණනය කරන්න.

(ලකුණු 06)

(ඇ) සපයන ලද තොරතුරු සහ ගණනය කරන ලද අනුපාත භාවිතා කරමින්, විගණන අවදානම් අටක් විස්තර කොට සහ Bricks (Pvt) Ltd හි විගණනය සැලසුම් කිරීමේදී එක් එක් අවදානම සඳහා විගණකවරයාගේ ප්‍රතිචාරය පැහැදිලි කරන්න.

(ලකුණු 16)

**(මුළු ලකුණු 25)**

## ප්‍රශ්ණ අංක 02

Flex PLC කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති අතර, පාරිභෝගික භාණ්ඩ, තොග ගනුදෙනුකරුවන්ට අලෙවි කරයි. සමාගමට විශාල ප්‍රධාන කාර්යාලයක් සහ ගබඩා 18 ක් ඇත. ඔබ CLP Partners හි විගණන අධීක්ෂකවරයෙකු වන අතර, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අවසන් විගණනය ළඟදීම ආරම්භ කිරීමට නියමිතය. මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් වලට අනුව මුළු වත්කම් රුපියල් මිලියන 98.5 ක් සහ බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 6.1 කි. පහත කරුණු තුන ඔබේ අවධානයට යොමු කර ඇත.

### ඉඩම් සහ ගොඩනැගිලි

Flex PLC ඓතිහාසිකව සියලුම දේපල, පිරියත සහ උපකරණ (දේ.පි.උ) පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩුකර වාර්තා කර ඇත. කෙසේ වෙතත්, වසර තුළදී, ඉඩම් සහ ගොඩනැගිලි සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය, පිරිවැය ක්‍රමයේ සිට ප්‍රත්‍යාගණන ක්‍රමය දක්වා වෙනස් කිරීමට කළමනාකාරිත්වය තීරණය කළේය. මූල්‍ය අධ්‍යක්ෂවරයා විසින් සියලුම ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා බාහිර ස්වාධීන

තක්සේරුකරුවෙකු බඳවා ගත් අතර, මෙය 2020 ජූලි මාසයේදී සිදු විය. ක්ෂයවීම් මාසිකව ගණනය කෙරේ. දේ.පි.උ. සඳහා Flex PLC හි වසර අවසාන ශේෂයට රුපියල් මිලියන 19.2ක (2020 – රුපියල් මිලියන 4) ඉඩම් සහ ගොඩනැගිලි ඇතුළත් වේ.

**වෙළඳ ලැබිය යුතු මුදල්**

Flex PLC හි වසර අවසාන වෙළඳ ලැබිය යුතු ශේෂය වන රුපියල් මිලියන 1.3 (2020 - රුපියල් මිලියන 0.7) පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. Flex PLC හි ලැබිය යුතු ලෙජරය රුපියල් 15,000 සිට රුපියල් 150,000 දක්වා ශේෂයන් සහිත පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවකින් සමන්විත වේ. 2021 මාර්තු 31 වන දින Flex PLC හි ලැබිය යුතු ලෙජරයට අනුව ශේෂයන්ට පාරිභෝගිකයන්ගෙන් බහුතරයක් එකඟ වූ නමුත්, පහත සඳහන් ව්‍යතිරේක සටහන් කර ඇත.

| **පාරිභෝගිකයා** | **Flex PLC අනුව ශේෂය** | **පාරිභෝගිකයාගේ ප්‍රතිචාරය** |
|---|---|---|
| Nimz PLC | රු.141,102 | ප්‍රතිචාරයක් නැත |
| Hemax PLC | රු.136,321 | රු.122,189 |

**දෝෂ සහිත භාණ්ඩ විකිණීමෙන් පැන නගින ප්‍රතිපාදන සහ ලැබිය යුතු දේ**

2020 දෙසැම්බරයේදී, Flex PLC විසින් ඔවුන්ගේ පාරිභෝගිකයකු වන Kidz (Pvt) Ltd හට විදුලි උපකරණ රැසක් විකුණා ඇත. විදුලි උපකරණ කැඩී ගිය අවස්ථා කිහිපයක් ඇති බැවින්, මෙම විදුලි උපකරණ දෝෂ සහිත බවට Kidz (Pvt) Ltd විසින් චෝදනා කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, Kidz (Pvt) Ltd විසින් Flex PLC සමාගමට රුපියල් මිලියන 0.9ක් ඉල්ලා නඩු පවරයි. උසාවි නඩුව 2021 අගෝස්තු මාසයේදී පැවැත්වීමට නියමිත අතර, කළමනාකාරිත්වය විශ්වාස කරන්නේ Kidz (Pvt) Ltd හි හිමිකම් පෑම සාර් ථක වීමට ඉඩ ඇති බවයි. වසර අවසානයේ Flex PLC හි බඩු තොගයේ විදුලි උපකරණ කිසිවක් ඉතිරි නැත.

Flex PLC විසින් විදුලි උපකරණ මිල දී ගෙන ඇත්තේ, Thomas (Pvt) Ltd යන සැපයුම්කරුවෙකුගෙන් ය. 2021 පෙබරවාරි මාසයේදී, දෝෂ සහිත විදුලි උපකරණ විකිණීමේ ප්‍රතිඵලයක් ලෙස ගෙවිය යුතු හානි සඳහා Flex PLC හට ප්‍රතිපූරණය කරන ලෙස Flex PLC විසින් Thomas (Pvt) Ltd වෙත ඉල්ලීමක් කරන ලදී. Flex PLC විසින් Thomas (Pvt) Ltd ගෙන් රුපියල් මිලියන 0.9 ක් ඉල්ලා සිටී. පාරිභෝගිකයාගේ වගකීම පියවීම වෙනුවෙන් රුපියල් මිලියන 0.9 ක් සඳහා ප්‍රතිපාදනයක් ද, Flex PLC විසින් ඔවුන්ගේ සැපයුම්කරු වෙත කල ප්‍රති වගකීම් වන රුපියල් මිලියන 0.9 ක ලැබියයුතු ශේෂයක් ද කෙටුම්පත් කල මූල්‍ය ප්‍රකාශන තුල දක්වේ.

*අවශ්‍ය වන්නේ:*

(අ) Flex PLC හි ඉඩම සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා විගණකවරයා විසින් සිදු කළ යුතු ප්‍රමාණාත්මක පටිපාටි විස්තර කරන්න.

(ලකුණු 07)

(ආ) Nimz PLC සහ Hemax PLC සම්බන්ධයෙන් සටහන් කර ඇති ව්‍යතිරේක සම්බන්ධයෙන් විගණකවරයා විසින් සිදු කළ යුතු ක්‍රියා පටිපාටි විස්තර කරන්න.

(ලකුණු 08)

(ඇ) දෝෂ සහිත භාණ්ඩ විකිණීමෙන් පැන නගින ප්‍රතිපාදන සහ ලැබිය යුතු ප්‍රතිපාදන සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා විගණකවරයා විසින් සිදු කළ යුතු ප්‍රමාණාත්මක පටිපාටි විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්ණ අංක 03

(අ) දැනට පවතින විගණන සේවාලාභියෙකු සඳහා ගිවිසුම් ලිපියක් සංශෝධනය කළ යුතු බව පෙන්නුම් කරන සාධක දෙකක් හඳුනාගෙන, පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) මූල්‍ය ප්‍රකාශනවලට ඍජු බලපෑමක් ඇති කරන නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් සහ ඍජු බලපෑමක් ඇති නොකරන නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ඇ) ජේම්ස් වරලත් ගණකාධිකාරී සමාගමේ, විගණන කළමණාකරුවෙකු විසින් Felena (Pvt) Ltd හි අභ්‍යන්තර පාලන ඇගයීමකින් තොරව, ඔහුගේ විගණන වැඩසටහන සකස් කර ඇත. හවුල්කරු, විගණන කළමණාකරුගෙන් හේතුව විමසූ විට, ඔහු ප්‍රකාශ කළේ සමාගම් පාලනයන්, Felena (Pvt) Ltd. හි සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් සකස් කරන ලද බවයි. ඔහු වරලත් ගණකාධිකාරීවරයෙකු සහ "අභ්‍යන්තර පාලනය" පිළිබඳ පොත් කිහිපයක් ලියා ඇති අයෙකු වන අතර, එම නිසා එම ක්ෂේත්‍රය සමාලෝචනය කිරීමට අවශ්‍ය නොවූ බවයි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

## ප්‍රශ්න අංක 04

ඔබ Nilkam Partners හි විගණන කළමනාකරුවෙකු වන අතර, ණය ඇතුළු මූල්‍ය සේවා රැසක් සපයන බැංකු ආයතනයක් වන Fitz Finance PLC හි විගණනය සැලසුම් කරමින් සිටී. ඔබේ සමාගම Fitz Finance PLC හි වසර හතරක් විගණනය කර ඇති අතර, සමාගමේ වසර අවසානය 2021 මාර්තු 31 වේ. 2021 පෙබරවාරි අවසානයේ, Fitz Finance PLC හි මූල්‍ය පාලක ඉවත්ව ගිය අතර, ඔහුගේ තනතුර ප්‍රතිස්ථාපනය කිරීම වසර අවසානයේ සිට මාස දෙකකට පමණ පසුව ආරම්භ වේ. විගණන නියැලීමේ හවුල්කරුගේ සහෝදරිය වන මූල්‍ය අධ්‍යක්ෂවරයා ඉල්ලා ඇත්තේ, විගණන කණ්ඩායමේ සාමාජිකයෙකු තාවකාලික මූල්‍ය පාලකවරයා ලෙස කටයුතු කිරීම සඳහා මාස තුනකට Fitz Finance PLC වෙත ඉල්ලා සිටිය හැකි දැයි කියාය.

දැනට විගණන කණ්ඩායම් සාමාජිකයින් ගණනාවක් Fitz Finance PLC සමඟ බැංකු කටයුතු කරන බවත්, කණ්ඩායම් සාමාජිකයින් දෙදෙනෙකු සමාගමට සැලකිය යුතු ණය මුදලක් ඇති බවත් ඔබ දනී. Nilkam Partner හි බදු අංශය ද Fitz Finance PLC වෙත සේවාවන් සපයයි. බදු අධිකාරීන් සමඟ ඇති සමහර විශේෂ ගැටළු විසඳීම සඳහා තමන්ව නියෝජනය කිරීමට Fitz Finance PLC විසින් Nilkam Partner හි බදු අංශය සේවාවට යොදා ගන්නා අතර, ඒ සඳහා සඳහා සැලකිය යුතු අගයක් ගෙවයි. විගණනය අවසන් වූ පසු, මුළු කණ්ඩායමම සහභාගී වී සුඛෝපභෝගී ආහාර වේලක් ලබා ගැනීමට තමන් කැමති බව මූල්‍ය අධ්‍යක්ෂවරිය විගණන කටයුතු හවුල්කරුට දන්වා ඇත.

*අවශ්‍ය වන්නේ:*

(අ) Fitz Finance PLC හි විගණනයේ දී, Nilkam Partners හි ස්වාධීනත්වයට බලපාන සදාචාරාත්මක තර්ජන පහක් හඳුනාගෙන පැහැදිලි කරන්න: සහ

(ලකුණු 10)

(ආ) එක් එක් තර්ජනය සඳහා, එය පිළිගත හැකි මට්ටමකට අඩු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)
**(මුළු ලකුණු 25)**

## ප්‍රශ්න අංක 05

පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) අපේක්ෂිත පරිශීලකයින් (Intended Users)
(ආ) පාලන අවදානම් (Control Risk)
(ඇ) ව්‍යතිරේක මතය (Qualified Opinion)
(ඉ) නියැලීමේ තත්ත්ව පාලන සමාලෝචක (Engagement Quality Control Reviewer)
(ඊ) සීමිත සහතික කිරීම් කටයුතු (Limited Assurance Engagement)

**(ලකුණු 05 x 05 = මුළු ලකුණු 25)**